සිංහල පරිවර්තනය

උ.ප.රා.සේ.කො.සභා චක්‍රලේඛ අංක : **02/2021**

මගේ අංකය : **NP/07/10/01/144**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය,
27.01.2021

ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය,
පළාත් අධ්‍යක්ෂ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
යාපනය/වවුනියාව/මන්නාරම/කිලිනොච්චිය/මුලතිව්

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ කෘෂි උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය – *2021*

උතුරු පළාත් රාජ්‍ය සේවයේ කෘෂි උපදේශක III වන ශ්‍රේණියේ තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පැවැත්වීමට නියමිත බව දන්වා ඇත. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 12.02.2021 වන දිනයවනු ඇත.

### 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසීන් :-

02.1 උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද කෘෂි උපදේශක සේවා ව්‍යවස්ථාව හා බඳවා ගැනීමේ පරිපාටියෙන් නිර්දේශ කර ඇති කොන්දේසීන් හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 හා 2013.07.03 වන දින දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවාව සඳහා වූ ආයතන කාර්ය පටිපාටි සංග්‍රහයටද අනුකූලව, තෝරාපත් කර ගන්නා විභාග අපේක්ෂකයන් අදාල කෘෂි උපදේශක තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත් වන විභාග අපේක්ෂකයන් පත්වීම් ලද දින සිට වසරක් වැඩ බැලීමේ කාර්යක්ෂමතා පදනම මත එම තනතුරට පත්කිරීමට නියමිතය. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි කෘෂි උපදේශක තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගන්නා ලද දින සිට වසර 03 ක කාලය තුළ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතු යි.

02.3 මෙම සේවය ස්ථාන මාරුවීම් වලට යටත් වූ සේවයක් වන බැවින් මෙම තනතුරට පත්වීම් ලබන අයදුම්කරුවන් උතුරු පළාතේ කුමණ ප්‍රදේශයක වුවද සේවයක කළ යුතුයි යන කොන්දේසියට යටත් විය යුතුයි.

02.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා එම චක්‍රලේඛය ආශ්‍රිතව වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ යනාදියට අනුකූලව පත්වීම් දින සිට වසර 05ක් ඉක්මවීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගත යුතුයි.

02.5 පත්වීම් සංඛ්‍යාව හා එම පත්වීම් ක්‍රියාත්මක වන දිනය වන කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. නිවේදනය කරන ලද පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ සියළු පුරප්පාඩු පූර්ණය නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය. පත්කිරීම සඳහා අපේක්ෂා කරන පත්වීම් සංඛ්‍යාව 10 කි.

### 03. වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016ට අනුකූව, වැටුප් කේතය **MN 3 – 2016**ට අනුකූලව කෘෂි උපදේශක සේවයේ III වන ශ්‍රේණියට අයත් ඒකාබද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ රුපියල් **31, 040 –10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57, 550/-** වේ. (රුපියල් 32,375 යන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම 1වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී සිටිය යුතුයි)

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා මනා කායික නිරෝගීතාවයකින් යුතු හා මනා චරිතයක් ඇති කෙනෙකු විය යුතු යි.

04.3 අයදුම්කරු, අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනට හෝ ඊට ප්‍රථම සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

04.4 සීමිත තරග විභාගය මඟින් බඳවා ගන්නා විට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

**05.1 අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අධ්‍යාපන පොදු සහතික (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකින් භාෂාව හෝ සාහිත්‍යය (දෙමළ/සිංහල/ඉංග්‍රීසි) ගණිතය හා විද්‍යාව යන විෂයන් ඇතුළුව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමඟම**

**ආ) වෘත්තීය සුදුසුකම් :-**

1. කුණ්ඩසාලෙයි, අගුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදුව, වාරියපොළ, වවුනියාව, අනුරාධපුරය, කරපිංච යන ප්‍රදේශයන් හි පිහිටි කෘෂිකර්ම විද්‍යාලයකින් වසර දෙකක(02) කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

අම්පාර හාඩි තාක්ෂණවේදී ආයතනයෙන් කෘෂි තාක්ෂණ ඩිප්ලෝමා සහතිකයන් ලබා තිබිය යුතුයි.

**හෝ**

ඇක්කුවයිනස් (Aquinas) විද්‍යාලයේ වසර දෙකක (02) කෘෂි ඩිප්ලෝමා ලබා තිබිය යුතුයි.

**හෝ**

2. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත වෘත්තීය සහතික ප්‍රදානය කරන ආයතන වල උපදෙස් ලබාගත් පසු අවශ්‍යතාවය අනුව ඉහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලට සියළුම ආකාරයෙන් සමාන බවට තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් හෝ අනුමත කරන ලද වෙනත් කුමක් හෝ තාක්ෂණික සුදුසුකම්.

**හෝ**

3. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්ව විද්‍යාලයකින් පහත සඳහන් විෂයයන් ගෙන් එකකට ලබා ගත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබිය යුතු යි.
   අ. කෘෂි විද්‍යා උපාධිය [B.Sc (Agriculture)]
   ආ. කෘෂි තාක්ෂණය හා කළමනාකරණ විද්‍යාවේදී උපාධිය [B.Sc (Agriculture Technology and Management)]
   ඇ. අපනයන කෘෂි විද්‍යා උපාධිය [B.Sc (Export Agriculture)]
   ඈ. තල් හා රබර් තාක්ෂණ විද්‍යා උපාධිය [B.Sc (Palm and Latex Technology)]

**05.2 වෙනත් සුදුසුකම් :-**

උතුරු පළාත් තාක්ෂණ සහකාර **(කෘෂි ව්‍යාප්ත)** සේවයේ ස්ථිර තනතුර දරණ එම තනතුරේ ස්ථිර කර ඇති අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම වසර පහක් (05) සක්‍රිය හා සතුටුදායක ලෙස සේවය කර තිබිය යුතු අතර, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එය සහතික කර තිබිය යුතුයි.

**සටහන :**

තාවකාලික/අනියම් පදනම මත සේවය කර ඇති කාලපරිච්ඡේදය ඉහත 05.2 හි සඳහන් සුදුසුකම් ලැබීම සඳහා වූ වසර පහක(05) කාලසීමාවක් ලෙස ගණනය කළ නොයුතුයි.

**සැලකිය යුතුයි :**

**අයදුම්කරු තනතුරට අදාළ සුදුසුකම් සියල්ල 12.02.2021 වැනි දිනට හෝ ඊට ප්‍රථම සපුරා තිබීම අනිවාර්යය වේ.**

## 06. බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 ලිඛිත පරීක්ෂණයක් මගින් කුසලතාව පදනම් කර ගෙන, බඳවා ගනුලබන අවස්ථාවේදී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පටිපාටින්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදියට යටත්ව බඳවා ගැනීමේ කටයුතු සිදු කරනු ලැබේ. මෙම දැන්වීම මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. මේ සඳහා ලකුණු කිසිවක් ප්‍රදාන කරනු නොලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බවට අනාවරණ වන විට මෙම තනතුර සඳහා වූ අයිතිවාසිකම් සියල්ල අහෝසි කරනු ලැබේ.

06.2 ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ගෙන්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් ලබාගන්නා සම්පූර්ණ ලකුණු අනුපිළිවෙළ පරිදි පත්වීම් සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06.1 පුරප්පාඩු වලින් 03% ක් විශේෂිත අවශ්‍යතාවයන් ඇති අපේක්ෂකයන්(ආබාධිත) සඳහා වෙන් කරනු ලැබේ. විභාග අපේක්ෂකයකු පත්වීම සඳහා තෝරාපත් කර ගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීම සඳහා තම විශේෂ අවශ්‍යතාවය (ආබාධිත තත්වය) බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සහතික කළ යුතුයි. එසේ නමුත් විශේෂ අවශ්‍යතාවයක් ඇති විභාග අපේක්ෂකයෙක් පත්වීම සඳහා සුදුසුකම් ලබා ගන්නේ ලිඛිත පරීක්ෂණයෙන් අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා පදනම මතයි.

## 07. විභාග ගාස්තු :-

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් 500/-ක් **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ "3401"** අංකය දරණ තැන්පත් ගිණුමට ගෙවන ලද කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන පරිදි අලවා යොමු කළ යුතුයි. මෙම ගාස්තු කුමණ හේතුවක් නිසා හෝ නැවත ගෙවනු නොලැබේ. එමෙන් ම මෙම ගාස්තුව වෙනත් විභාගයක් සඳහා ද මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම් කළ යුතු ක්‍රමය :-

08.1 මෙම දැන්වීම අවසානයේ පෙන්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අදාළව A4 ප්‍රමාණයේ (21සෙ.මී x 29සෙ.මී) කඩදාසියක 1 සිට 4.4 දක්වා වූ ඡේද පළමු පිටුවේ ද, 4.5 සිට 7.0 දක්වා වූ ඡේද දෙවන පිටුවේද ඉතිරි කොටස් තුන්වන පිටුවට ද අන්තර්ගත වන පරිදි අයදුම්පත්‍රය සකස් කරගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 12.02.2021වන දිනට හෝ ඊට ප්‍රථම "ලේකම්, **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම් උඩු කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ කෘෂි උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය -2021"** යනුවෙන් සඳහන් කළ යුතුයි

08.3 අයදුම්පත්‍රයේ ඡායා පිටපත තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පත්‍රයේ ඡායා පිටපත හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදි භාරගනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් යථා කාලයේදී නිකුත් කරනු **ලැබේ.** විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරුට සියලුම ආකාරයෙන් සුදුසුකම් ඇති බවට සැළකීමක් නොවේ.

08.4 අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන්ට විභාග දිනයට අවම වශයෙන් දින 03කට ප්‍රථම හෝ ප්‍රවේශ පත්‍ර නොලැබුණේ නම්, වහාම ඒ බවට අවශ්‍ය තොරතුරු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය්"** යන ලිපිනයට දන්වා එවිය යුතුයි. (දුරකථන අංකය – 021 221 9939, ෆැක්ස් අංකය - 021 221 9940)

**ඉදිරිපත් කළ යුතු තොරතුරු :-**

**ආවරණ ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ ඡායාපිටපත, ප්‍රවේශපත්‍ර යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකය.**

## 09. අනන්‍යතාවය සනාථ කිරීම :-

අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයයකටම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි තම අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් කුමක් හෝ එක් ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතුයි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත

(ii) වලංගු ශ්‍රී ලංකාවේ ගුවන් බලපත්‍රය

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිලි වලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව උතුරු පළාත ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකි බව දන්වා සිටිනු ලැබේ. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නියම කරන නීතිරීතින්ට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි.

## 10.ව්‍යාජ තොරතුරු සඳහා වන දඬුවම :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම විභාග රීතීන් පරිදි අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ කුමණ අවස්ථාවකදී වුවද සුදුසුකම් නැතිබවට අනාවරණය වුවහොත් එස අපේක්ෂකයාගේ විභාග අපේක්ෂකත්වය එම අවස්ථාවේදී ම අහෝසි කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කළ කුමක් හෝ කරුණක් ව්‍යාජ තොරතුරක් බවට අනාවරණය වුවහොත් එම අයදුම්කරු පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

## 11.විභාග සැලැස්ම :-

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම විභාගය සිංහලෙන් හා දෙමළ යන මාධ්‍යය වලින් පැවැත්වීමට නියමිතය. අයදුම් කළ භාෂාව නැවත වෙනස් කිරීමට අවස්ථාවක් නොලැබේ.

| අංක | ප්‍රශ්න පත්‍ර | විෂය මාලාව | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රයට තර්කානුකූල කුසලතාව, විශ්ලේෂණ කුසලතාව, තීරණය කිරීමේ හැකියාව, තීරණයකට එළඹීමේ කුසලතාව. සංඛ්‍යා, භාෂාව හා රූප යනාදිය අතර ඇති සබැඳියාවන් හා ගැටළු නිරාකරණ කරන ආකාරය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කරන ලද්දෙකි. | කාලය 01 | 100 |
| 02 | තාක්ෂණ සම්බන්ධ අධ්‍යයන පරීක්ෂණය | කෘෂි කර්මය සම්බන්ධ නවීකරණය හා ගැටළු නිරාකරණය කිරීමේ කුසලතාවය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. | කාලය 01 | 100 |

**සටහන :-**

මෙය තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහ ප්‍රතිශතයක් (40%) ලබා ගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් මෙම තරඟ විභාගයෙන් ලබාගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් ඉහළ ලකුණු අනුපිළිවෙල(Merit Order) සැළකිල්ලට ගනු ලැබේ.

## 12. විභාග ප්‍රතිඵල :-

විභාග අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලබන අතර විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂකයන්ට තැපැල් මගින් ද නිකුත් කරනු ලැබේ.

13. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා සතුය. මෙම දැන්වීමේ දෙමළ හා සිංහල භාෂා මාධ්‍යයන් අතර කිසියම් අනනුකූලතාවයක් පැනනගින අවස්ථාවක් වුවහොත් එවිට දෙමළ භාෂා මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු සිදුකරනු ලැබේ

**එස්.තිරුවාකරන්.**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
27.01.2021